සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2015 ජූලි

## (AA31) මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Financial Accounting and Reporting)

2015-08-01
සෙනසුරාදා
[9.00 – 12.00]

පිටු ගණන : 12
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***කාලය:*** *පැය 03 යි.*

(2) ***ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ ලකුණු වෙන් කිරීම:***

| කොටස | අවශ්‍යතාවය | ලකුණු |
|---|---|---|
| A | සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයීම අනිවාර්ය වේ. | 20 |
| B | සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයීම අනිවාර්ය වේ. | 30 |
| C | ප්‍රශ්න තුනෙන් දෙකකට පමණක් උත්තර සැපයිය යුතුය. | 50 |
| **මුළු ලකුණු** | | **100** |

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

---

## A කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

1.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වූ සංකල්පමය ආකෘතිමය රාමුව (conceptual framework) යම් යම් කරුණු සම්බන්ධයෙන් කටයුතු කරයි.

(a) එමගින් කටයුතු කෙරෙන එබඳු කරුණු තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) "පොදු අරමුණු සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන" යන්නෙහි තේරුම **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

**1.2** අලුතෙන් පිහිට වූ නිෂ්පාදන ව්‍යාපාරයක් වන **සීමාසහිත ABC සමාගම,** 2014 අප්‍රේල් 01 දින එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කළේය. 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල පහත සඳහන් තොරතුරු සමාගමේ පොත් වලින් උපුටා ගන්නා ලදි:

| | **රු.** |
|---|---|
| පරිභෝජනය කල අමුද්‍රව්‍ය වල පිරිවැය | 500,000 |
| මූළු ඍජු ශ්‍රම පිරිවැය | 550,000 |
| වෙනත් විචල්‍ය නිෂ්පාදන පිරිවැය | 380,000 |
| වර්ෂය සඳහා ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය | 260,000 |
| මූළු ඍජු ශ්‍රම පිරිවැයෙහි ඇතුලත් අක්‍රිය (Idle) ශ්‍රම පිරිවැය (අනපේක්ෂිත වැඩ නැවතීම් නිසා) | 20,000 |
| පරිපාලන පොදුකාර්ය | 240,000 |

| | **ඒකක** |
|---|---|
| නිෂ්පාදන පහසුකම්වල සාමාන්‍ය ධාරිතාව | 40,000 |
| වර්ෂය තුල සත්‍ය නිෂ්පාදනය | 32,000 |
| වර්ෂය තුල විකුණන ලද ඒකක ගණන | 28,000 |

සමාගම තනි නිෂ්පාදිතයක් පමණක් නිෂ්පාදනය කිරීමෙහි නියැලී සිටී යැයි උපකල්පනය කරන්න.

2015 මාර්තු 31 දිනට තිබූ නිමි භාණ්ඩ වල වටිනාකම **තක්සේරු කරන්න**. (ලකුණු 05)

**1.3** පහත සඳහන් තොරතුරු **සිග්මා සමාගමට** අදාල වේ:

(a) 2015 මාර්තු 31 දිනට **සිග්මා සමාගමේ** වෙළෙඳ ලැබිය යුතු ඇ ශේෂයෙහි **ඔමෙගා** වෙතින් ලැබිය යුතු රු.28,000/- ක ප්‍රමාණයක් ඇතුලත් විය. 2015 අප්‍රේල් 10 දින, **ඔමෙගා** බුන්වත් බව ප්‍රකාශ කරනු ලැබිණි.

(b) වැඩ කරන වේලාවේදී ආරක්ෂිත තොප්පි නොමැතිවීම හේතුවෙන් **සිග්මා සමාගමේ** සේවකයෙකුගේ හිසට සිදුවූ හානියක් සම්බන්ධයෙන් රු100,000/- ක වන්දියක් ඉල්ලා එම සේවකයා විසින් 2015 මාර්තු 20 දින සමාගමට එරෙහිව නඩුවක් පවරා ඇත. මෙම සේවකයාට රු.100,000/- ක් ගෙවන ලෙස 2015 මැයි 31 දින උසාවිය සමාගමට නියෝග කරන ලදි.

(**සිග්මා සමාගමේ,** මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කර ඇත්තේ 2015 ජූනි 20 බැව් උපකල්පනය කරන්න).

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 (LKAS 10) වාර්තාකරණ කාලච්ඡේදයට පසුව ඇතිවූ සිදුවීම් ප්‍රමිතයට අනුකූලව, ඉහත එක් එක් අවස්ථාව ඔබ විසින් ගිණුම්ගත කරන්නේ කෙසේදැයි, හේතු සහිතව, **සඳහන් කරන්න**.

(ලකුණු 05)

**1.4** 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් සමාගමක වගකීම (obligation of a company to prepare financial statements) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# <u>B කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 02 වන ප්‍රශ්නය

**සීමාසහිත මාටින් පොදු සමාගමේ** 2013 මාර්තු 31 දිනට, 2014 මාර්තු 31 දිනට සහ 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන ද 2014 මාර්තු 31 සහ 2015 මාර්තු 31 යන දින වලින් අවසන් වර්ෂ සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශන ද පහත දක්වා ඇත:

**සීමාසහිත මාටින් පොදු සමාගම**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන**

*(රු.'000)*

| | 2015 මාර්තු 31 දිනට | 2014 මාර්තු 31 දිනට | 2013 මාර්තු 31 දිනට |
|---|---|---|---|
| **වත්කම්:** | | | |
| **ජංගම නොවන වත්කම්:** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 45,000 | 35,000 | 40,000 |
| **ජංගම වත්කම්:** | | | |
| තොග | 14,000 | 12,000 | 11,600 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 12,750 | 13,750 | 10,558 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 100 | 250 | 500 |
| **මුළු වත්කම්** | **71,850** | **61,000** | **62,658** |
| | | | |
| **ස්කන්ධය සහ වගකීම්:** | | | |
| **ස්කන්ධය:** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 30,000 | 30,000 | 30,000 |
| රඳවාගත් ඉපැයීම් | 19,249 | 9,771 | 5,000 |
| **මුළු ස්කන්ධය** | **49,249** | **39,771** | **35,000** |
| **වගකීම්:** | | | |
| **ජංගම නොවන වගකීම්:** | | | |
| දිගු කාලීන ණය | 10,716 | 8,329 | 16,700 |
| **ජංගම වගකීම්:** | | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 11,885 | 12,900 | 10,958 |
| **මුළු වගකීම්** | **22,601** | **21,229** | **27,658** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **71,850** | **61,000** | **62,658** |

**සීමාසහිත මාටින් පොදු සමාගම**
**විස්තීර්ණ ආදායම් ප්‍රකාශ**

*(රු.'000)*

| දිනෙන් අවසන් වර්ෂ සඳහා | 2015 මාර්තු 31 | 2014 මාර්තු 31 |
|---|---|---|
| විකුණුම් | 148,000 | 110,000 |
| විකුණුම් පිරිවැය | (99,600) | (76,500) |
| **දළ ලාභය** | **48,400** | **33,500** |
| මෙහෙයුම් වියදම් | (33,936) | (25,750) |
| **මෙහෙයුම් ලාභය** | **14,464** | **7,750** |
| මූල්‍ය වියදම් | (2,133) | (1,582) |
| **බදු පෙර ලාභය** | **12,331** | **6,168** |
| ආදායම් බදු වියදම් | (2,853) | (1,397) |
| **වර්ෂය සඳහා ලාභය** | **9,478** | **4,771** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **9,478** | **4,771** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) සලකා බලන වර්ෂයන් තුළදී ලාභාංශ ගෙවීම් කර නොතිබුණි.

(2) විකුණුම් සියල්ල ණය පදනම මත සිදුකර ඇත.

(3) වර්ෂයකට දින 365 ක් යැයි උපකල්පනය කරන්න.

**ඔබ විසින්,**

2014 මාර්තු 31 සහ 2015 මාර්තු 31 දිනයන්ගෙන් අවසන් වර්ෂ සඳහා පහත සඳහන් අනුපාත **ගණනය කරන්න**:

(a) දළ ලාභ අනුපාතය.

(b) යෙදවූ ප්‍රාග්ධනය සඳහා ප්‍රතිලාභ අනුපාතය (ROCE).

(c) වත්කම් පිරිවැටුම් අනුපාතය.

(d) සාමාන්‍ය තොග නේවාසික කාලය.

(e) සාමාන්‍ය ණය එකතු කිරීමේ කාලය. (ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

(a) 2014 අප්‍රේල් 01 දින **සීමාසහිත වඩ්ලි සහ පුත්‍රයෝ (පෞද්ගලික) සමාගම** විසින් **සීමාසහිත ගොගෝ මූල්‍ය පොදු සමාගමෙන්** මූල්‍ය කල් බද්දක් යටතේ ලොරි රථයක් මිලදී ගන්නා ලදී. කල් බද්දට අදාල විස්තර පහතින් දී ඇත.

| | |
|---|---|
| ලොරි රථයේ සාධාරණ වටිනාකම | රු.1,000,000/- |
| කල් බද්දේ කාල සීමාව | වර්ෂ 5 කි. |
| බදු කුලිය (lease rental) | එක් එක් වර්ෂය අවසානයේ ගෙවිය යුතු වූ වාර්ෂික බදු කුලිය රු.280,854/- කි. |
| ආරෝපිත (implicit) පොලී අනුපාතිකය | 12.5% |
| වර්ෂ 5 න් පසු සුන්බුන් අගය | කිසිවක් නැත. |
| ලොරි රථයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය | වර්ෂ 5 කි. |

**ඔබ විසින්,**

(i) ඉහත කල්බදු ගනුදෙනු සටහන් කිරීම සඳහා **සීමාසහිත ඩඩ්ලි සහ පුත්‍රයෝ (පෞද්ගලික) සමාගමේ** පොත්වල අදාල ලෙජර් ගිණුම් **පිළියෙල කරන්න**.

(ii) 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සහ 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ උධෘත (extracts) **පිළියෙල කරන්න**. (ලකුණු 06)

(b) ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් පිළිබඳව වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 (LKAS 37) අනුව, "සම්මුතික බැඳීම" (Constructive Obligation) යන්න උදාහරණයක් සහිතව **පැහැදිලි කරන්න**.
(ලකුණු 04)
(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත සේයා සමාගමේ** 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් පහත සඳහන් ශේෂ උපුටාගෙන ඇත:

| | **රු.** |
|---|---|
| කාර්යාල උපකරණ (පිරිවැයට) | 461,000 |
| සමුච්චිත ක්ෂය | (175,000) |
| **2015 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | **286,000** |

2015 මාර්තු 31 දිනට පිරිවැය රු.90,000/- ක් සහ ශුද්ධ පොත් අගය රු.67,500/- ක් වූ කාර්යාල උපකරණ අයිතමයක ප්‍රත්‍යාගණිත වටිනාකම (revalued amount) රු.40,000/- ක් බව 2015 ජූනි 30 දින සිදුකරන ලද ප්‍රත්‍යාගණනයෙන් හෙළිදරව් විය. සමාගමේ ප්‍රතිපත්තිය වන්නේ කාර්යාල උපකරණ පිරිවැය මත වර්ෂයකට 20% බැගින් සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කිරීම ය.

අනෙකුත් සියලුම කාර්යාල උපකරණ අයිතමයන්ගේ සාධාරණ අගයන් එදිනට ඒවායෙහි ශුද්ධ පොත් අගයන්ට සමාන වූවා යැයි උපකල්පනය කරන්න.

**ඔබ විසින්,**

(i) 2015 ජූනි 30 දිනට ඉහත ප්‍රත්‍යාගණනය ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන් පොදු ජර්නලයේ **සටහන් කරන්න**.

(ii) 2015 ජූනි 30 දිනට ප්‍රත්‍යාගණනය ඇතුලත් කිරීමෙන් පසු කාර්යාල උපකරණවල ශුද්ධ පොත් අගය **ගණනය කරන්න**. (ලකුණු 06)

(b) ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ දෝෂ පිළිබඳව වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 (LKAS 8) ට අනුව "ඉදිරි කාලීන ව්‍යවහාරය" (Prospective Application) "අතීතානුයෝගී ව්‍යවහාරය" (Retrospective Application) යන්නෙන් **වෙනස්කොට දක්වන්න**. (ලකුණු 04)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

ප්‍රශ්න දෙකකට (02) පමණක් උත්තර සැපයිය යුතුය.

(මුළු ලකුණු 50)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත මයික්‍රෝ සමාගම,** කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත සමාගමකි. 2015 මාර්තු 31 දිනට සමාගමේ ශේෂ පිරික්සුම පහත සඳහන් පරිදි වේ:

**සීමාසහිත මයික්‍රෝ සමාගම**

**2015 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | **හර** | **බැර** |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටස් 2,000,000) | | 23,100 |
| වරණීය කොටස් ප්‍රාග්ධනය (කොටස් 100,000) | | 9,000 |
| 16% ණයකර | | 3,500 |
| 2014 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයුම් | | 725 |
| <u>දේපළ, පිරියත හා උපකරණ - පිරිවැයට</u> | | |
| ඉඩම | 16,800 | |
| ගොඩනැගිල්ල | 11,300 | |
| ගොඩනැගිල්ල (නොනිමි වැඩ) (Work-In-Progress - WIP) | 1,300 | |
| මෝටර් වාහන | 9,250 | |
| කාර්යාල උපකරණ | 2,640 | |
| ලී බඩු සහ සවිකිරීම් | 2,200 | |
| <u>2014 අප්‍රේල් 01 දිනට ක්ෂය සඳහා වෙන් කිරීම</u> | | |
| ගොඩනැගිල්ල | | 8,475 |
| මෝටර් වාහන | | 4,550 |
| කාර්යාල උපකරණ | | 1,584 |
| ලී බඩු සහ සවිකිරීම් | | 1,100 |
| 2015 මාර්තු 31 දිනට තොග - පිරිවැයට | 7,550 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ / වෙළෙඳ ගෙවිය යුතු දෑ | 22,450 | 17,571 |
| 2013/14 තක්සේරු වර්ෂය සඳහා බදු වගකීම | | 400 |
| උපචිත වියදම් | | 434 |
| බැංකු ණය | | 2,367 |
| බැංකුවේ සහ අතැ'ති මුදල් | 1,081 | |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 70,015 | 105,500 |
| ගෙවූ වරණීය ලාභාංශ | 50 | |
| පරිපාලන වියදම් | 15,950 | |
| විකිණීමේ සහ බෙදාහැරීමේ වියදම් | 13,350 | |
| වෙනත් මෙහෙයුම් වියදම් | 3,375 | |
| මූල්‍ය ගාස්තු | 220 | |
| ගෙවන ලද ආදායම් බදු | 775 | |
| | **178,306** | **178,306** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2015 මාර්තු 31 දින, සමාගම 5% ක අධි මිලකට සියලුම ණයකර නිදහස් කරන ලදි. සමාගම, එදිනම වර්ෂය සඳහා උපචිත පොලිය ද ගෙවන ලදි. මෙම නිදහස් කිරීම සම්බන්ධයෙන් කරන ලද සියලුම ගෙවීම්, වැරදීමකින් වෙළෙඳ ගෙවිය යුතු දැ ගිණුමෙහි සටහන් කර තිබුණි.

(2) 2014 සැප්තැම්බර් 30 දින, සමාගම, එහි පැරණි ලොරි රථ වලින් එකක් අලුත් ලොරි රථයකට හුවමාරු කළේය. පැරණි ලොරි රථයේ පිරිවැය රු.950,000/- ක් වූ අතර එය 2012 අප්‍රේල් 01 දින මිලයට ගෙන තිබුණි. සමාගම, හුවමාරු ගනුදෙනුවේ ශේෂය පියවීම සඳහා රු.800,000/- ක් ගෙවූ අතර, එය මෝටර් රථ ගිණුමට හර කරන ලදි. අලුත් ලොරි රථයේ වටිනාකම රු.1,250,000/- ක් විය. මේ පිළිබඳව වෙනත් සටහන් කිසිවක් ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.

(3) වර්ෂය තුළ සමාගම, පහත සඳහන් වත්කම් මිලදී ගෙන ඇත:

| දිනය | වත්කම | වටිනාකම (රු.) |
|---|---|---|
| 2014.05.01 | ස්කෑන් යන්ත්‍රය | 900,000 |
| 2015.01.01 | පොත් රාක්ක | 160,000 |

(4) පිරිවැය හෝ ප්‍රත්‍යාගණිත අගය මත පදනම්ව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණ වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල | : | වර්ෂ 20 |
| මෝටර් වාහන | : | වර්ෂ 5 |
| කාර්යාල උපකරණ | : | වර්ෂ 5 |
| ලී බඩු හා සවිකිරීම් | : | වර්ෂ 10 |

සමාගමේ ප්‍රතිපත්තිය වන්නේ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සම්පූර්ණ වනතුරු ගොඩනැගිල්ලේ නොනිමි වැඩ සඳහා ක්ෂය ප්‍රතිපාදනය නොකිරීම ය.

(5) වර්ෂය අවසානයේ දී රු.117,000/- ක වෙළෙඳ ලැබිය යුතු ශේෂයක් අයකරගත නොහැකිවන බව තහවුරු වන ලදි. අඩමාණ ණය සඳහා රු.345,000/- ක පොදු ප්‍රතිපාදනයක් (general provision) ඇති කළ යුතුව තිබේ.

(6) 2015 මාර්තු 31 දිනට උපචිත වියදම් සඳහා පහත පරිදි වෙන් කිරීම් කළ යුතු වේ:

| | රු. |
|---|---|
| විගණන ගාස්තු සහ වෙනත් වෘත්තීය ගාස්තු | 255,000 |
| දුරකතන, ජලය සහ විදුලිය | 17,000 |

(7) හිඟ බැංකු ණය ශේෂයෙන් රු.800,000/- ක් ඊළඟ වර්ෂය තුළ පියවිය යුතුව තිබේ.

(8) 2015 මාර්තු 31 දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු.7,300,000/- ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි.

(9) 2013/14 තක්සේරු වර්ෂයේ ආදායම් බදු වගකීම රු.350,000/- ක් ලෙස එකඟ වී තිබූ අතර, එය 2014/15 තක්සේරු වර්ෂය තුළ ගෙවන ලදී. 2014/15 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ බදු වගකීම රු.510,000/- ක් ලෙස ඇස්තමේන්තු කර තිබේ.

(10) 2015 මැයි 15 දින පවත්වනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 2015 මාර්තු 31 දිනට පැවති සෑම සාමාන්‍ය කොටසකටම සත පනහ (-/50) බැගින් වූ අවසාන ලාභාංශයක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී.

(11) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 ජූනි 20 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

**ඔබ විසින්,**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන් **සීමාසහිත මයික්‍රෝ සමාගමේ**, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 09)

(b) 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(c) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දක්වන ප්‍රකාශනය. (ලකුණු 04)

(d) දේපළ, පිරියත සහ උපකරණ වලට සටහන්. (ලකුණු 03)

(මුළු ලකුණු 25)

## 06 වන ප්‍රශ්නය

(a) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 27 (LKAS 27) ඒකාබද්ධ සහ වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන ප්‍රමිතය ප්‍රකාර පහත සඳහන් යෙදුම් (terms) **නිර්වචනය කරන්න**:

(i) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (Consolidated Financial Statements).

(ii) පාලනය නොවන හිමිකම (Non-controlling Interest).

(iii) පාලනය (Control). (ලකුණු 06)

(b) 2013 අප්‍රේල් 01 දින, **සීමාසහිත බීටා පොදු සමාගමේ** රඳවාගත් ඉපැයීම් ශේෂය රු.1,400,000/- ක් වශයෙන් සඳහන්ව තිබියදී **සීමාසහිත ඇල්ෆා පොදු සමාගම, සීමාසහිත බීටා පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 75% ක්, අත්පත් කර ගත්තේය. අත්පත් කරගත් දිනට **සීමාසහිත බීටා පොදු සමාගමේ** හඳුනා ගත හැකි ශුද්ධ වත්කම් වල සාධාරණ වටිනාකම (fair value of identifiable net assets) රු.6,100,000/- ක් විය.

මෙම ශුද්ධ වත්කම්වල සාධාරණ වටිනාකම හා ඒවායේ පොත් අගය අතර කිසියම් වෙනස්වීමක් වෙතොත්, එසේ වන්නේ සරල මාර්ග ක්‍රමය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කරනු ලබන මෝටර් වාහනයේ වටිනාකම වැඩිවීම නිසායැයි උපකල්පනය කරන්න.

2015 මාර්තු 31 දිනට, සමාගම් දෙකෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශ පහත දක්වා ඇත:

**2015 මාර්තු 31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශ** *(රු.'000)*

| | **සීමාසහිත ඇල්ෆා පොදු සමාගම** | **සීමාසහිත බීටා පොදු සමාගම** |
|---|---|---|
| **වත්කම්:** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත හා උපකරණ | 14,500 | 2,845 |
| **සීමාසහිත බීටා පොදු සමාගමේ** ආයෝජනය | 5,000 | - |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 6,300 | 3,950 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 3,540 | 1,590 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 450 | 260 |
| | **29,790** | **8,645** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය) | 20,000 | 4,000 |
| රඳවාගත් ඉපැයීම් | 2,375 | 1,700 |
| **ජංගම නොවන වගකීම්:** | | |
| බැංකු ණය | 1,500 | 950 |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 5,640 | 1,635 |
| උපචිත වියදම් | 275 | 360 |
| | **29,790** | **8,645** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) **සීමාසහිත බීටා පොදු සමාගමෙහි** නිකුත් කළ, සහ ගෙවා නිමි කොටස් 400,000 ක් තිබූ අතර, 2013 අප්‍රේල් 01 දිනෙන් පසු අලුතෙන් කිසිදු කොටස් නිකුතුවක් සිදුකර නොතිබුණි. මෙම කොටස් වල වෙළෙඳපොල වටිනාකම, 2013 අප්‍රේල් 01 දිනට, කොටසකට රු.15/- බැගින් විය. පරිපාලිත ඒකාබද්ධ කිරීමේදී **සීමාසහිත ඇල්ෆා පොදු සමාගම** විසින් සම්පූර්ණ කීර්තිනාම ක්‍රමය (full goodwill method) අනුගමනය කරනු ලැබේ.

(2) **සීමාසහිත ඇල්ෆා පොදු සමාගම** පිරිවැය මත 25% ක ලාභයක් සහිතව **සීමාසහිත බීටා පොදු සමාගම** වෙත භාණ්ඩ විකිණීම සිදු කරනු ලැබේ. 2015 මාර්තු 31 දිනට **සීමාසහිත බීටා පොදු සමාගමේ** තොගයෙහි **සීමාසහිත ඇල්ෆා පොදු සමාගමෙන්** මිලදී ගත් රු.440,000/- ක භාණ්ඩ ඇතුලත් විය.

(3) මිලට ගන්නා ලද භාණ්ඩ වෙනුවෙන් වූ හිඟ බිල්පත් පියවීම සඳහා **සීමාසහිත බීටා පොදු සමාගම** විසින් 2015 මාර්තු 30 දින, **සීමාසහිත ඇල්ෆා පොදු සමාගම** වෙත රු.350,000/- ක් ප්‍රේෂණය කරන ලදී. මෙම මුදල **සීමාසහිත ඇල්ෆා පොදු සමාගමට** ලැබී තිබුණේ 2015 අප්‍රේල් 04 දින බැවින් එදින ඒ සඳහා ගිණුම් තබන ලදී.

(4) 2015 මාර්තු 31 දින කරනු ලැබූ හානිකරණ පරීක්ෂාවෙන් (Impairment test) අනාවරණය වූයේ ඒකාබද්ධ කිරීම මත වූ කීර්තිනාමය රු.150,000/- කින් හානිකරණය (impaired) වී ඇති බවය.

**ඔබ විසින්,**

(i) ඒකාබද්ධ කිරීම මත කීර්තිනාමය **ගණනය කරන්න**.

(ii) ඒකාබද්ධ රඳවාගත් ඉපැයීම් ගිණුම **පිළියෙල කරන්න**.

(iii) පාලනය නොවන හිමිකම් ගිණුම **පිළියෙල කරන්න**.

(iv) 2015 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 19)

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත බෑන්ඩ් හවුස් සමාගමේ** 2014 මාර්තු 31 දිනට සහ 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පහත දක්වා ඇත:

**සීමාසහිත බෑන්ඩ් හවුස් සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | **2015 මාර්තු 31 දිනට** | | **2014 මාර්තු 31 දිනට** | |
|---|---|---|---|---|
| **වත්කම්**<br>**ජංගම නොවන වත්කම්:** | | | | |
| **දේපළ, පිරියත හා උපකරණ:** | | | | |
| ඉඩම | | 6,500 | | 6,500 |
| ගොඩනැගිලි | 2,215 | | 2,215 | |
| අඩු කළා: සමුච්චිත ක්ෂය | (1,550) | 665 | (1,440) | 775 |
| මෝටර් වාහන | 2,750 | | 1,500 | |
| අඩු කළා: සමුච්චිත ක්ෂය | (1,812) | 938 | (1,125) | 375 |
| කාර්යාල උපකරණ | 695 | | 855 | |
| අඩු කළා: සමුච්චිත ක්ෂය | (560) | 135 | (513) | 342 |
| | | 8,238 | | 7,992 |
| ආයෝජන | | 1,600 | | 1,600 |
| අඩු කළා: හානිකරණය සඳහා ප්‍රතිපාදනය | | (100) | | - |
| | | **9,738** | | **9,592** |
| **ජංගම වත්කම්:** | | | | |
| තොග | | 510 | | 455 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | | 2,750 | | 2,890 |
| ලැබිය යුතු ආයෝජන ආදායම | | 18 | | 25 |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | | 67 | | 55 |
| | | 3,345 | | 3,425 |
| **මුළු වත්කම්** | | **13,083** | | **13,017** |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | |
| **ස්කන්ධය:** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 7,000 | | 7,000 |
| රඳවාගත් ඉපැයීම් | | 1,792 | | 635 |
| | | **8,792** | | **7,635** |
| **ජංගම නොවන වගකීම්:** | | | | |
| 15% ණයකර | - | | 2,500 | |
| බැංකු ණය | 1,120 | | 1,620 | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම (Retirement Benefit Obligation) | 600 | 1,720 | 550 | 4,670 |
| | | **10,512** | | **12,305** |
| **ජංගම වගකීම්:** | | | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 2,442 | | 594 |
| උපචිත වියදම් | | 55 | | 45 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 48 | | 35 |
| ගෙවිය යුතු බැංකු ණය පොලී | | 26 | | 38 |
| | | **2,571** | | **712** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **13,083** | | **13,017** |

**සීමාසහිත බැන්ඩ් හවුස් සමාගම**
**2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය** *(රු.'000)*

| | | |
|---|---|---|
| විකුණුම් | | 18,600 |
| විකුණුම් පිරිවැය | | (8,800) |
| **දළ ලාභය** | | **9,800** |
| **වෙනත් ආදායම්:** | | |
| ආයෝජන ආදායම | 175 | |
| කාර්යාල උපකරණ විකිණීමෙන් ලද ලාභය | 60 | 235 |
| | | 10,035 |
| **අඩුකළා: වියදම්** | | |
| බෙදාහැරීමේ වියදම් | 4,670 | |
| පරිපාලන වියදම් | 3,210 | |
| මූල්‍ය වියදම් | 488 | (8,368) |
| **බදු පෙර ලාභය** | | **1,667** |
| ආදායම් බදු වියදම් | | (510) |
| **බදු පසු ලාභය** | | **1,157** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | **1,157** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2015 මාර්තු 31 දින, සමාගම එහි ණයකර සියල්ලම නිදහස් කර ඇත.

(2) බැංකු ණය සඳහා ගෙවූ පොලිය සහ ණයකර සඳහා ගෙවූ පොලිය මූල්‍ය වියදම් මගින් නියෝජනය වේ.

(3) 2011 අප්‍රේල් 01 දින රු.160,000/- කට මිලදීගත් කාර්යාල උපකරණයක් 2014 සැප්තැම්බර් 30 දින ඉවත් කරන ලදී. සමාගමේ ප්‍රතිපත්තිය කාර්යාල උපකරණ වර්ෂ 5 ක් තුළ ක්ෂය කිරීම ය.

(4) වර්ෂය තුළ සමාගම අලුත් ලොරි රථයක් මිලදී ගත්තේය.

(5) ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය අයකිරීම් රු.956,000/- ක් වේ.

(6) වර්ෂය තුළ ආයෝජන වල වෙළෙඳපොළ වටිනාකම රු.100,000/- කින් අඩුවී ඇති බව සමාගම හඳුනාගන්නා ලද අතර, එම හානිකරණය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කරන ලදී.

(7) සමාගම වර්ෂය සඳහා පාරිතෝෂික ප්‍රතිපාදනය ලෙස රු.200,000/- ක් ප්‍රතිපාදනය කරන ලදී.

**ඔබ විසින්,**

වක්‍ර ක්‍රමය භාවිත කර, 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත බැන්ඩ් හවුස් සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය **පිළියෙල කරන්න.**

(ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>අවබෝධය<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | හඳුනා දක්වන්න | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | සඳහන් කරන්න | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම. |
| | විමසන්න | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | පැහැදිලි කරන්න | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | අර්ථකතනය කරන්න | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | හඳුනාගන්න | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | සටහන් කරන්න | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | සාරාංශගත කරන්න | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>භාවිතය<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | ප්‍රදර්ශනය කරන්න | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | පිළියෙල කරන්න | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | ප්‍රමුඛතා දක්වන්න | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | සසඳන්න | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>විශ්ලේෂණය<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | සමානකම් බලන්න | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |